සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජනවාරි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2018-01-20
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත ටේස්ටි සමාගම,** බිස්කට් නිෂ්පාදනය කර ශ්‍රී ලංකාව පුරා විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටින ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සමාගමකි. **සීමාසහිත ටේස්ටි සමාගමේ** මෙහෙයුම්වලට බාහිර පරිසරය බලපෑම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ටේස්ටි සමාගමේ** ව්‍යාපාරයට බලපාන බාහිර පරිසරයේ සංරචක තුනක්(03), එක් එක් සංරචකය සඳහා උදාහරණයක් සමඟ **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත බ්‍රීස් (පෞද්ගලික) සමාගම,** වර්ෂ 15 කට පෙර සංස්ථාපනය කරන ලද වගකීම් සීමාසහිත සමාගමකි. ව්‍යාපාරය වර්ධනය වෙමින් පවතින අතර, ලාභදායකද වේ. සමාගම කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමට අධ්‍යක්ෂකවරු සැලසුම් කරමින් සිටිති. සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයේ (Code of Best Practice on Corporate Governance) පරිදි ලැයිස්තුගත සමාගමක් විසින් වේතන කමිටුවක් (remuneration committee) සහ විගණන කමිටුවක් පත්කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන කමිටුවේ කාර්යභාරයන් තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) වේතන කමිටුවේ කාර්යභාරයක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

"තත්ත්ව පාලන පටිපාටීන් (quality control procedures) ආයතන මට්ටමෙන් (firm level) සහ තනි තනි විගණන මට්ටමෙන් ක්‍රියාත්මක කර අනුගමනය කළ යුතුයි."

**ඔබ විසින් කළ යුතු දෑ:**

තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

"සාධාරණ සහතිකවීම (reasonable assurance) යනු සාපේක්ෂව ඉහළ මට්ටමේ සහතිකවීමකි. සාධාරණ සහතිකවීමේ කාර්යභාරයකදී, සාධාරණ සහතිකවීම ලබා ගැනීමට සහතිකවීමේ කාර්යභාරයේ අවදානම, කාර්යභාරයේ අවස්ථානුකූලභාවය මත පිළිගතහැකි තරම් පහළ මට්ටමකට අඩු කිරීමෙන් වෘත්තියේ යෙදෙන්නාට ඔහුගේ මතය ධනාත්මක ස්වරූපයෙන් ප්‍රකාශ කළ හැකිවේ."

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් (reasonable assurance engagement) සඳහා උදාහරණයක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සීමිත සහතිකවීමේ කාර්යභාරයකදී, වෘත්තියේ යෙදෙන්නෙකු විසින් සෘණාත්මක ස්වරූපයේ මතයක් ප්‍රකාශ කරනු ලැබීමට හේතුව **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

(A) අවස්ථානුකූලව යෝග්‍ය සහ ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමේ අරමුණ සඳහා විගණන පටිපාටි සැලසුම්කිරීම සහ ඉටුකිරීම විගණක විසින් කළ යුතුවේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍ය බව යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) "බාහිර සනාථ කිරීම" (external confirmation) යන පදය, උදාහරණයක් සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(B) **සීමාසහිත රත්න පොදු සමාගම** සේවයෙන් විශ්‍රාම යන තම සේවකයන්ට ගෙවීම සඳහා නිර්වචිත ප්‍රතිලාභ සැලැසුමක් (defined benefit plan) ක්‍රියාත්මක කරයි. වාර්තා කරන කාලපරිච්ඡේදය (reporting period) අවසානයේදී නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ආශ්‍රිත වගකීම් ගණනය කර ඇස්තමේන්තු කිරීම සඳහා සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු (actuary) **සීමාසහිත රත්න පොදු සමාගම** යොදා ගනී. කාලපරිච්ඡේදය අවසානයේදී ගෙවිය යුතු නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ලබාගැනීම සඳහා ප්‍රධාන උපකල්පන (උදා: වට්ටම් අනුපාතිකය, වැටුප් වර්ධක අනුපාතිකය, සේවක පිරිවැටුම් අනුපාතිකය ආදිය) ආයුගණක විසින් භාවිත කර ඇත. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම තුළින් පැන නගින වගකීම පිළිබඳව සහ ආයුගණක විසින් ඉටුකරන ලද කාර්යයන් ප්‍රමාණවත්දැයි ඇගයීමේ කාර්යය ඔබ වෙත පැවරී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

විශේෂඥයෙකු විසින් ඉටුකරන කාර්යභාරය ලෙස ආයුගණකගේ වැඩ වල යෝග්‍ය බව සහ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සඳහා ඔබ විසින් සලකා බලනු ලබන කරුණු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත සෝෆා (පෞද්ගලික) සමාගම,** ගෘහභාණ්ඩ අයිතම නිෂ්පාදනයේ නිරතව සිටී. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කෙරෙන විගණන කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨයා ඔබ වේ. සමාගමේ පසුගිය වර්ෂයේ විගණනය ඔබගේ ආයතනය විසින් සිදුකරන ලද නිසා නව විගණන සේවයේ යෙදවීමේ ලිපියක් ඔබ ආයතනයෙන් ලබා දි නැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සේවයේ යෙදවීමේ ලිපියක (engagement letter) අරමුණ **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) **සීමාසහිත සෝෆා (පෞද්ගලික) සමාගමේ** විගණන සේවයේ යෙදවීමේ ලිපියේ කොන්දේසි සංශෝධනය කිරීමට විගණක විසින් තීරණය කිරීම සඳහා තුඩුදිය හැකි සාධක තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(B) ශ්‍රී ලංකාව පුරා කෙසෙල්ගෙඩි විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටින සමාගමක් වන **සීමාසහිත රස කෙසෙල් (පෞද්ගලික) සමාගමේ (RK),** ව්‍යවස්ථාපිත විගණනයේ කාර්යභාර හවුල්කරු ඔබ වේ. **RK** වර්ෂ ගණනාවක සිට ඔබගේ විගණන සේවාදායකයෙකු වන අතර, ඔබ ආයතනයේ ලොකුම සේවාදායකයන්ගෙන් කෙනෙකුද වෙයි. ඔබගේ ආයතනය කාර්යමණ්ඩලයේ කිහිපදෙනෙකු සහිත කුඩා අස්තිත්වයකි.

මෑතකදී **RK** හි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ඔබ හමුවී තම සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය (internal control system) පිළිබඳ පරිපූර්ණ සහ ගැඹුරු සමාලෝචනයක් ඉටුකිරීම, අභ්‍යන්තර පාලනය මත හඳුනාගත් දුර්වලතා වාර්තා කිරීම සහ එම අභ්‍යන්තර පාලන දුර්වලතා සඳහා පිළියම් නිර්දේශ කිරීම ඔබ සමාගමේ විගණන කණ්ඩායමට ඉටු කළ හැකිදැයි ඉල්ලා සිටියේය. මෙම සමාලෝචනය ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරලීමේ පරිශ්‍රමයේ කොටසක් බව **RK** හි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා අවධාරණය කර සිටියේය. මෙය විගණනය ආරම්භ කිරීමට පෙර ඉටුකරනු ලැබිය යුතු වෙනමම කාර්යභාරයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

විගණනය සම්බන්ධයෙන් සහ යෝජිත කාරයභාරය පිළිගැනීම සම්බන්ධයෙන් විගණකගේ ස්වාධීනත්වය (independence) කෙරෙහි ඇතිවිය හැකි තර්ජන (threats) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

රත්නපුරයේ ස්ථානගතවී තිබෙන **සීමාසහිත සෙවන සර්විසස් (පෞද්ගලික) සමාගමේ** බාහිර විගණනය ඔබ විසින් සම්පූර්ණ කරන ලදී. අයහපත් කාලගුණය සහ ගංවතුර තත්ත්වයන් නිසා මෙම සමාගමේ මාස තුනක ගිණුම් වාර්තා මුළුමනින්ම ලබාගැනීමට නොහැකි වී තිබුණි.

විගණනය අවසන් වූ වහාම, කෙටුම්පත් විගණන වාර්තාව සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා වෙත බාර දෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණකයෙකු විසින් විකරණය නොකළ විගණන මතයක් (unmodified audit opinion) ප්‍රකාශ කරන්නේ කුමන අවස්ථාවන්හිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) (i) විගණක විසින් විගණන වාර්තාවෙහි කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් (an emphasis of matter paragraph) ඇතුළත් කළ යුත්තේ ඇයිදැයි හේතුව **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(ii) කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් විගණක විසින් ඇතුළත් කිරීමට තුඩුදෙන අවස්ථා සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ස්වර්ණා සෙරමික්ස් (පෞද්ගලික) සමාගම, (SC)** පිඟන් භාණ්ඩ සිල්ලර වෙළඳාමේ යෙදී සිටී. නුගේගොඩ අංක 555 දරණ ස්ථානයේ එහි ප්‍රදර්ශනාගාරය ඇති අතර, ගබඩාව පිහිටා ඇත්තේ නුගේගොඩ අංක 565 දරණ තැනයි.

මිලදී ගනු ලබන අයිතම ගබඩාවට ලැබුණු විට ගබඩා ලිපිකරු විසින් භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව [Goods Received Note (GRN)] පිළියෙල කොට එය කාර්යාලයට යවයි. අදාළ සැපයුම්කරුට දැනුම්දීම සඳහා භාණ්ඩ ලැබෙන අවස්ථාවේදීම හානිවූ අයිතම හඳුනා ගනියි.

ගනුදෙනුකරුවන් අයිතම ප්‍රදර්ශනාගාරයෙන් තෝරාගන්නා විට ප්‍රදර්ශනාගාරයේ අයකැමිට ඔවුන් විසින් මුදල් ගෙවිය යුතුවේ. ප්‍රදර්ශනාගාර අයකැමි අතින් ලියා ඉන්වොයිසි පිළියෙල කරයි. ගනුදෙනුකරුවන් ප්‍රදර්ශනාගාරයෙන් ඉන්වොයිසි ලබාගෙන ගබඩා ලිපිකරු වෙත ඉදිරිපත් කරනු ලබයි. ගබඩා ලිපිකරු භාණ්ඩ බාරදීමේ සටහන (dispatch note) පිළියෙල කර කම්කරු කාර්ය මණ්ඩලයට බාරදෙන අතර, ඔවුන් විසින් අදාල අයිතම ගනුදෙනුකරුවන්ගේ වාහනවලට පටවනු ලබයි.

ඔබ සමාගමට අලුතෙන් පත්කළ ගණකාධිකාරීවරයා වන අතර, ඔබ පහත සඳහන් දෑ නිරීක්ෂණය කරයි:

- පසුගිය මාස දෙක සඳහා මාසික භෞතික තොග සත්‍යාපනය සිදුකර නැත. 2017 ඔක්තෝම්බර් වාර්තාවෙහි අයිතමවල අඩුවක් පෙන්නුම් කරයි.
- ගනුදෙනුකරුවන්, ඔවුන් විසින් ගෙවීම් කරන ලද අයිතම ගණන්වලට වඩා අඩු අයිතම ගණනක් ලැබී ඇති බවට පැමිණිලි කර ඇත.
- හානි වූ අයිතම සැලෙන ප්‍රමාණයක් ගබඩාවෙන් පිටත තිබී ඇත.
- එක්තරා දිනයක එම දිනයේ සත්‍ය මුදල් එකතුවීම්වලට වඩා අඩු මුදල් ප්‍රමාණයක් ප්‍රදර්ශනාගාර අයකැමි විසින් තැන්පත් කර තිබුණි. මේ ගැන ඇයගෙන් විමසන ලද කල්හි, ඇය ඔබට දන්වා ඇත්තේ එම මුදල් කාර්යමණ්ඩල සුබසාධන අයිතම මිලදී ගැනීම සඳහා වියදම් කළ බවයි.

ඉන්වොයිසිකරණය, තොග නඩත්තුව සහ වෙනත් මූල්‍ය ක්‍රියාවලීන් සඳහා පරිගණකගත තොරතුරු පද්ධතියක (computerized information system) වැදගත්කම පිළිබඳව කළමනාකාරීත්වය සමඟ ඔබ සාකච්ඡා කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත විස්තර කර ඇති විකුණුම් ක්‍රියාවලියෙහි ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(b) ඉහත (a) හි හඳුනා දැක්වූ දුර්වලතා **SC** හි කළමනාකාරීත්වය විසින් මගහරවා ගන්නේ කෙසේදැයි යන්නට එක් එක් දුර්වලතාවය සඳහා නිර්දේශයක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 05)

(c) ඉන්වොයිසිකරණය, තොග නඩත්තුව සහ වෙනත් මූල්‍ය ක්‍රියාවලි සඳහා පරිගණකගත තොරතුරු පද්ධතියක තිබිය යුතු තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් (IT General Controls) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(d) ඉහත (c) හි හඳුනා දැක්වූ එක් එක් තොරතුරු තාක්ෂණ පොදු පාලනයක් සඳහා උදාහරණ දෙකක් (02) බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(B) **ටෙස්කෝ ශ්‍රී ලංකා (TSL)** කොළඹ අවන්හල් දාමයක් මෙහෙයවන සමාගමකි.

**TSL සමාගමේ** මව් සමාගම [**ටෙස්කෝ ග්ලොබල්** (**Tesco Global - TG**)] විසින්, **TSL** හි කාර්යසාධනය දිනපතා සුපරීක්ෂණය කරයි. මෙම අරමුණ සඳහා, **TSL** අවන්හල්වල ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය මැන බැලීම සඳහා නිශ්චිත ප්‍රධාන කාර්යසාධන දර්ශක [Key Performance Indicators (KPIs)] කට්ටලයක් සකස් කර තිබේ. එක් එක් ප්‍රධාන කාර්යසාධන දර්ශකය ගණනය කිරීමේ ක්‍රමය **TSL** සඳහා ඇති **TG** හි මෙහෙයුම් අත්පොතෙහි විශේෂයෙන් සඳහන් කර තිබේ. කාර්තුව සඳහා වන අදාල ගනුදෙනුකරුවන්ගේ පසු විපරම් ආකෘති (feedback forms) වලින් දත්ත ලබාගත යුතුය. එක් එක් කාර්තුව අවසානයේදී ඉහත කී ප්‍රධාන කාර්යසාධන දර්ශක කට්ටල (KPI) ඇතුළත් ප්‍රකාශනයක් **TSL විසින් TG** වෙත ඉදිරිපත් කළ යුතුය.

2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා වූ KPI ප්‍රකාශනයේ විශ්වසනීයබව පරීක්ෂා කිරීමට, **TSL** හි බාහිර විගණක විසින් සමාලෝචනය කිරීම **TG** හට අවශ්‍යව තිබේ. මෙම ප්‍රකාශනය මත සහතික කිරීමේ වාර්තාවක් (assurance report) නිකුත් කිරීම බාහිර විගණකගෙන් අපේක්ෂා කෙරේ.

**ඔබ විසින් කළ යුතු දැ:**

සහතිකවීමේ වාර්තාවක් සැපයීම සඳහා **TSL** හි බාහිර විගණක විසින් ඉටුකළ යුතු සහතිකවීමේ කාර්යභාරයේ ප්‍රධාන මූලිකාංග තුනක්(03) **විමසන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

**සීමාසහිත ටියාරා සමාගම,** එයටම අයිති රෙදිපිළි වෙළෙඳසැලක් මෙහෙයවන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමකි. මෙම සමාගම ඉහළ මට්ටමේ වියදම් දරණ ගනුදෙනුකරුවන් සඳහා නවතම ප්‍රංශ විලාසිතා රටා සහිත සවසට අඳින ඇඳුම් ආනයනය කර විකිණීමේ යෙදී සිටී. එහි ගනුදෙනුකරුවන් ඇනුවත් බවින් යුක්ත අතර විලාසිතා පිළිබඳ දැඩි උනන්දුවක් දක්වන නිසා වෙළෙඳසැලෙහි යල්පනින ලද (out-of-season) ඇඳුම් කිසිවක් වෙතොත් ඒවායේ අලෙවිකරණ හැකියාව ඉතා ඉක්මනින් නැතිවී යන්නේය. ශ්‍රී ලංකාවේ විලාසිතා කර්මාන්තය ඉතාමත් ඉහළ තරඟකාරීත්වයකින් යුතු අතර, ගනුදෙනුකරුවන්ගේ කැමැත්ත විසින් මෙහෙයවනු ලබයි.

වර්ෂයේ ප්‍රථම භාගයේ විලාසිතා නැඹුරුව මැක්සි ඇඳුම් (maxi dress) වූ අතර, එය ගනුදෙනුකරුවන් අතර බෙහෙවින් ජනප්‍රිය විය. මැක්සි ඇඳුම් සඳහා ඉහළ ඉල්ලුමක් අපේක්ෂාවෙන් **සීමාසහිත ටියාරා සමාගම,** 2017 පෙබරවාරි මාසයේදී රු. මිලියන 15 ක් වටිනා මැක්සි ඇඳුම් ආනයනය කළේය. 2017 අගෝස්තු මාසය වනවිට එහි ගනුදෙනුකරුවන් අතර අත් රහිත ඇඳුම (sleeveless dress) ඉතාමත් ජනප්‍රිය විය. 2017 දෙසැම්බර් 31 දිනට **සීමාසහිත ටියාරා සමාගමේ** රු. මිලියන 5 ක් වටිනා අත්රහිත ඇඳුම් තොගයක්ද, රු. මිලියන 2 ක් වටිනා මැක්සි ඇඳුම් තොගයක්ද, එහි ගබඩාවේ තිබුණේය.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ටියාරා සමාගමේ** විගණනය ඔබ වෙත පවරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එකිනෙක සඳහා උදාහරණයක් බැගින් දෙමින් අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධ කරගැනීමේදී ඔබ විසින් සළකා බැලීමට අවශ්‍ය කරන ව්‍යාපාරයේ පොදු ක්ෂෙත්‍ර (general areas) තුනක්(03) **හඳුනා දක්වන්න**.

(ලකුණු 06)

(b) (i) ඔබ විසින් හඳුනා ගැනීමට අපේක්ෂා කරන තොගවලට සම්බන්ධ විගණන අවදානමක් **හඳුනාගන්න**.

(ලකුණු 03)

(ii) ඉහත (i) අනුව හඳුනාගත් අවදානමට ප්‍රතිචාර ලෙස ඔබ විසින් ඉටුකරනු ලබන විගණන පටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(iii) **සීමාසහිත ටියාරා සමාගමේ** වර්ෂ අවසාන තොග ශේෂය ඇගයීම පරීක්ෂා කිරීම සඳහා ඔබ ඉටුකිරීමට සැලසුම්කරනු ලැබිය හැකි වෙනත් තහවුරු කිරීමේ පටිපාටියක් (substantive procedure) **හඳුනා දක්වන්න.**

(ලකුණු 02)

(c) විගණන සාක්ෂි ලබාගැනීම සඳහා පහත දක්වා ඇති විගණන පටිපාටි වර්ග, එක් එක් පටිපාටිය සඳහා උදාහරණයක් සමඟ **සසඳන්න**:

(i) විමසීමට එරෙහිව නිරීක්ෂණය.

(ii) නැවත ගණනය කිරීමට එරෙහිව නැවත ඉටු කිරීම. (ලකුණු 06)

(d) පහත සඳහන් සැපයුම්කරුවෙකුගේ ප්‍රකාශනයේ සැසඳීම ඔබ වෙත සපයා ඇත. මෙම සැසඳීම **සීමාසහිත ටියාරා සමාගමේ** ණයහිමියෙකුට අදාල වේ:

| | රු. | රු. |
|---|---|---|
| ණයහිමි ලෙජරය අනුව ශේෂය | | 150,000 |
| එකතු කළා: | | |
| ලෙජරයේ සටහන් කර නැති සැපයුම්කරු විසින් එවන ලද භාණ්ඩ | 60,000 | |
| සැපයුම්කරු විසින් තවමත් හඳුනා නොගත් ආපසු යැවුම් | 18,000 | |
| සැපයුම්කරු විසින් තවමත් හඳුනා නොගත් ගෙවීම් | 200,400 | 278,400 |
| **සැපයුම්කරුගේ ප්‍රකාශය අනුව ශේෂය** | | **428,400** |

මෙම සැසඳුම සම්බන්ධයෙන් ඔබ විසින් ඉටුකිරීමට සැලසුම්කරන විගණන පටිපාටි දෙකක්(02) **හඳුනා දක්වන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |